# ආරක්ෂක අමාත්‍යාංශය

## ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (NBRI)

## පුරප්පාඩු

**ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙහි (NBRI) පවතින පහත සඳහන් පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.**

### 1. කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) MA 1-2, (iii ශ්‍රේණිය) (තනතුරු 14)

**බාහිර :**

**අධ්‍යාපන සුදුසුකම්**

(අ) අ.පො.ස (සා.පෙ) විභාගයෙන්,

i. සිංහල /දෙමළ /ඉංග්‍රීසි
ii. ගණිතය

ඇතුළුව විෂයයන් හතරක් (04) සඳහා සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයක් (06) සමත්වී තිබීම.

සහ

(ආ) අ.පො.ස (උ /පෙළ) විභාගයෙන් විෂයන් තුනක් (03) සමත්වී තිබීම.

**අභ්‍යන්තර :**

**අධ්‍යාපන සුදුසුකම්**

(අ) අ.පො.ස (සා.පෙ) විභාගයෙන්,

i. සිංහල /දෙමළ /ඉංග්‍රීසි
ii. ගණිතය

යන විෂයයන් ඇතුළත්ව විෂයයන් හතරක් (04) සඳහා සම්මාන සාමාර්ථ සමඟ විෂයයන් හයක් (06) සමත් වී තිබීම.

සහ

ජා.ගො.ප ආයතනයේ ප්‍රාථමික ශ්‍රේණිවල (ශිල්පීය/අර්ධ ශිල්පීය නොවන) සේවා ගණයේ තනතුරක ස්ථිර පදනමින් අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය** : කළමනාකරණ සහකාර, MA 1-2 (iii) සේවා ගණයේ
(රු. 46,220 - 10x 540 – 7x 630 -12 x 1080 -12x 1280 - 84,350/-)

**මූලික වැටුප් පියවර :** රු. 43,312 /-
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන ii පරිදි )

**වයස** : අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාවන් අදාළ නොවේ.

## 2. ප්‍රාථමික මට්ටමේ (ශිල්පීය නොවන) PL -1,(iii ශ්‍රේණිය) (තනතුරු 26 )

බාහිර සහ අභ්‍යන්තර

**අධ්‍යාපන සුදුසුකම්** : අ.පො.ස (සා.පෙ) විභාගයට පෙනී සිටීම සහ අදාළ තනතුරට වසරක (01) පළපුරුද්දක් තිබීම අමතර සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

**වැටුප් පරිමාණය** : PL -1, Gr iii සේවා ගණයේ (රු. 40,500- 10- 450- 10x 490 -7 x540 - 15x 590- 62,530/-)

**මූලික වැටුප් පියවර** : රු. 38,488 /- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන ii පරිදි )

**වයස** : අවුරුදු 18 ට නොඅඩුව සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාවන් අදාළ නොවේ.

**වෙනත් ප්‍රතිලාභ**

- ජීවන වියදම් දීමනාව
- ආයතනය විසින් සේවක අර්ථ සාධක අරමුදලට 12% ක් සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදලට 3% ක් වශයෙන් දායක වනු ඇත.
- රජයේ චක්‍රලේඛ අනුව වෛද්‍ය නිවාඩු සහ ප්‍රසාද දීමනා ගෙවනු ලැබේ.
- කාර්යසාධනය පදනම් කරගෙන දිරි දීමනා ගෙවීම.
- ජීවිත රක්ෂණ ආවරණය සහ වෛද්‍ය රක්ෂණ ආවරණය
- රජය විසින් අනුමත වෙනත් දීමනා

**සුදුසුකම් හා පළපුරුද්ද මත තෝරාගන්නා අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.**

රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල, ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන්, ස්වකීය අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

සියලු ජීව - දත්ත තොරතුරු සහිත අයදුම්පත් අදාළ සහතිකවල පිටපතක්ද සමඟ 2026.05.15 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කළ යුතුය. අයදුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ, පැහැදිලිව සටහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය**
**99/1, ජාවත්ත පාර,**
**කොළඹ 05.**